# අහිංසක රෝසී.....



අහිංසක රෝසි

කර්තෘ : පමිති අනුපද්‍රා පැහැසරණි රන්කොත්ගෙදර

: 4 – A ශ්‍රේණිය

: මහ/මහාමායා බාලිකා විද්‍යාලය

වෙනත් කෘති : ආඩම්බරකාර බෝනික්කි

කර්තෘ ප්‍රකාශනයකි

**ISBN Number : 978 – 624 – 208 – 462 – 6**

## පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත් කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට මෙවර පාසල් ප්‍රජාවට ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමු කරන හෙරණගත්කරණි ව්‍යාපෘතිය හදුන්වා දෙන්නට විය. මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවන් රටේ පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහනයක් ද වෙයි ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හදුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය

ශශිකලා සේනාධීර

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

එක් කම්කටොළු මැද ජීවත් වුන රෝසි ඉතා අහිංසක ළමයෙක්. එයාගේ තාත්තා නැතිවෙලා අම්මා සමඟ තමයි ජීවත් වුනේ.



ඉතින් මෙහෙම ඉන්නකොට ගුරුතුමී දවසක් ළමයින්ව විනෝද චාරිකාවක් රැගෙන යන බව පැවසුවා.

ඉතින් ළමයි හැමෝම සතුටු වුනා. තම නිවෙස් වලට ගිහිල්ලා දෙමාපියන්ට මේ බව දැන්වුවා. ඉතින් පුංචි රෝසිත් මේ ගැන තම මවට දැන්වුවා.

මව දස අතේ කල්පනා කළා පුංචි රෝසිව කෙහොමද චාරිකාව යවන්නේ කියලා.

“අනේ දුවේ අද රෑට මම බත් උයන්න හාල් ගත්තෙත් ණයට, මම කොහොමද ඔයාට චාරිකාව යන්න මුදල් හොයලා දෙන්නේ”.

පුංචි රෝසිට ගොඩක් දුකයි.

“කමක් නෑ අම්මේ අපි වෙන දවසක යමු දෙන්නත් එක්ක”

අම්මට දුක හිතෙයි කියන බයට හිනා වෙලා කිවුවා.

පසුවදා පාසැල් ගිය රෝසි ගුරුතුමියට දැන්වූවා තමන් නොඑන බව. ගුරුතුමියටත් යහළුවන්ටත් හරිම දුකයි.

ගුරුතුමිය කල්පනා කළා රෝසි ගොඩක් හොඳ දරුවෙක්.

ගුරුතුමි රෝසිට කතා කර තමන් ළගට එන්න කියා ගමන යන්න මුදල් දුන්නා.



රෝසි ඉතා සතුටින් යෙහෙළියන් සමග චාරිකාවට සහභාගි වුනා.

තමන්ගේ හිතහොඳ නිසා මේ අවස්ථාව උදා වූ බව රෝසිගේ මව රෝසිට පැහැදිලි කර දුන්නා.



\- නිමි -

## පසුවදන.



රටේ අනාගතය සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ත ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වාර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප පළාත් ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි. මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආශ්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකියග මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි එම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමටම හාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නියග සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිස පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂිංසනය.

ව්‍යාපෘති නිර්මාතෘ, සම්බන්ධීකාරක
සෙනෙවිරත්න
මහලේකම්